**සවියෙන් පෙරට - අපි එකට**

**e-ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | භූගෝල විද්‍යාව | 2 | 03. ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ අවකාශීය වෙනස්කම් |

**සැකසුම - එන්.ආර්.දමයන්ති, ශ්‍රීපාලි විද්‍යාලය**







# හැඳින්වීම..

- සංවර්ධනය යනු තනි නිර්වචනයක් ලබා දීමට අපහසු නිරන්තරයෙන් සිදුවන සංකීර්ණ ක්‍රියාවලියකි.
- කිසියම් ක්ෂේත්‍රයක වඩා යහපත් ලෙසට සිදු වන වෙනස් වීම ලෙස සරලව දැක්විය හැකිය.
- සංවර්ධනය මැනීම සඳහා විවිධ දර්ශක භාවිතා කරන අතර ඒවා හඳුනා ගෙන ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ අවකාශීය වෙනස්කම් කෙසේ දැයි සොයා බැලීම මෙහිදී සිදු කරයි.

# සංවර්ධනය නිර්වචනය කිරීම..

- සංවර්ධනය යනුවෙන් අදහස් කරන්නේ පොදුවේ මිනිසුන්ගේ ජීවිත වල සිදුවන ආර්ථික හා සමාජයීය දියුණුවකි. ඒ පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත.

## (1978 - යුනෙස්කෝ ප්‍රකාශය)

රටක ආර්ථික සංවර්ධනය මෙන් ම සමාජීය සංවර්ධනයක් ද ඇති විය යුතුය. සමාජීය සංවර්ධනය සිදු විය යුත්තේ ආහාර, පෝෂණය, අධ්‍යාපනය, නිවාස, සමාජ සුරක්ෂිතභාවය, ඇඳුම් පැළඳුම්,විවේකය හා මානුෂික නිදහස යනාදියේ ය.

සංවර්ධනය යනු ආර්ථික අංශයේ සිදුවන දියුණුව පමණක් නොව ඒ සමඟ මිනිසුන්ගේ ජීවන තත්ත්වය දියුණු වීම ද සිදුවිය යුතුය .

■ ඒ අනුව සංවර්ධනය යනු ,

ආර්ථික සමාජයීය සංස්කෘතික විවිධ අංශ වල දියුණුව සමගින් රටක ජනතාවට හොඳ ජීවන තත්ත්වයක් ලබා දීම ලෙස දැක්විය හැකිය. මිනිසුන්ගේ ජීවන තත්ත්වයේ දියුණුව ලෙස සැලකෙන්නේ අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිදුවන සංවර්ධනය යි.

# සංවර්ධන දර්ශක

ඒක ශීර්ෂ ආදායම

උපතේදී ආයු අපේක්ෂාව

සංවර්ධන දර්ශක

ළදරු මරණ අනුපාතය

සාක්ෂරතාව

# ඒක ශීර්ෂ ආදායම

කිසියම් රටක නිශ්චිත කාල සීමාවක් තුළ ජාතික ආදායමෙන් එක් පුද්ගලයෙකුට අයත් වන කොටස ඒක ශීර්ෂ ආදායම යි.

ගණනය කරන්නේ පහත ආකාරයට ය.

$$\text{ඒක ශීර්ෂ ආදයම} = \frac{\text{වර්ෂයක රටක මුළු ආදයම}}{\text{මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාව}}$$

# ළදරු මරණ අනුපාතිකය

- කිසියම් වර්ෂයක් තුළ වයස අවුරුදු එක සම්පූර්ණ වීමට පෙර මියයන ළදරුවන් සංඛ්‍යාව එම වර්ෂයේ සජීවී උපත් **1000** ට අනුපාතයක් සේ දැක්වීම ළදරු මරණ අනුපාතිකයයි.
- එය ගණනය කරන්නේ පහත ආකාරයට වේ.

$$\text{ළදරු මරණ අනුපාතිකය} = \frac{\text{වසරක් තුළ වයස අවුරුදු 1 ට අඩු අයගේ මරණ සංඛ්‍යාව}}{\text{එම වසරේ මුළු සජීවී උපත් සංඛ්‍යාව}} \times 1000$$

# උපතේදී ආයු අපේක්ෂාව

- උපතේ දී ආයු අපේක්ෂාව යනු පුද්ගලයකු උපත ලබන විට ඔහුට හෝ ඇයට හෝ ඉදිරියට ජීවත් විය හැකි කාලය කොපමණ දැයි සාමාන්‍යකරණය කර දැක්වීම යි. මෙම අගය රටක ආර්ථික හා සමාජ තත්ත්වය අනුව ද ස්ත්‍රී, පුරුෂ වශයෙන් ද වෙනස් වේ.
- මෙම දර්ශකය සකස් කරගැනීම තරමක් සංකීර්ණ සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රියාවලියකි.

# සාක්ෂරතාව

කිසියම් රටක ජන සංඛ්‍යාවේ වයස අවුරුදු **15** ට ඉහළ පුද්ගලයන්ගේ අකුරු කියවීමට හා ලිවීමට ඇති හැකියාව සාක්ෂරතාව ලෙස හඳුන්වයි. මෙය ගණනය කරනු ලබන්නේ වයස අවුරුදු **15** ට ඉහළින් මුළු ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙසිනි.

$$\text{සාක්ෂරතාව} = \frac{\text{වයස අවුරුදු 15ට ඉහළ අකුරු කියවීමට හා ලිවීමට හැකි පුද්ගලයන් සංඛ්‍යාව}}{\text{වයස අවුරුදු 15ට ඉහළ මුළු ජන සංඛ්‍යාව}} \times 100$$

# ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ අවකාශීය වෙනස්කම්

ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් බැවින් ප්‍රාදේශීය සංවර්ධනයේ විවිධ වෙනස්කම් දක්නට ඇත. ඉහත දර්ශක අනුව එය වෙනස් වන්නේ කෙසේ දැයි සොයා බැලීම මෙහිදී සිදු කරයි.

- ## මාසික කුටුම්භ ආදායම

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය වශයෙන් ආදායම් විෂමතාව තේරුම් ගැනීමට කුටුම්භ ආදායම භාවිතා කළ හැකි අතර 2009 වර්ෂයේ දී දිස්ත්‍රික්ක අනුව එහි වෙනස්කම් පහත වගුව අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි කරගත හැකි ය.

## 3.1 වගුව - ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව මාසික කුටුම්භ ආදායම - 2009

| දිස්ත්‍රික්කය | මාසික කුටුම්භ ආදායම (රුපියල්) | දිස්ත්‍රික්කය | මාසික කුටුම්භ ආදායම (රුපියල්) |
|---|---|---|---|
| කොළඹ | 51,070 | කිලිනොච්චිය | දත්ත ලැබී නැත |
| ගම්පහ | 48,870 | මඩකලපුව | 22,844 |
| කළුතර | 35,780 | අම්පාර | 24,721 |
| මහනුවර | 33,063 | ත්‍රිකුණාමලය | 24,291 |
| මාතලේ | 30,013 | කුරුණෑගල | 36,922 |
| නුවරඑළිය | 31,029 | පුත්තලම | 32,918 |
| ගාල්ල | 31,376 | අනුරාධපුරය | 37,586 |
| මාතර | 30,980 | පොළොන්නරුව | 31,526 |
| හම්බන්තොට | 36,879 | බදුල්ල | 32,313 |
| යාපනය | 18,917 | මොනරාගල | 22,161 |
| මන්නාරම | දත්ත ලැබී නැත | රත්නපුර | 41,312 |
| වව්නියාව | 39,640 | කෑගල්ල | 29,342 |
| මුලතිව් | දත්ත ලැබී නැත | | |

මූලාශ්‍රය : *Sri Lanka Human Development Report 2012*

# ඒක ශීර්ෂ ආදායම

ශ්‍රී ලංකාවේ ඒක ශීර්ෂ ආදායම (2012-2013) පහත වගුවෙන් දැක්වේ. එයට අනුව ,

දිස්ත්‍රික්කයන්හි  ඒක ශීර්ෂ ආදායම සලකා බැලීමේදී ,

- කොළඹ දිස්ත්‍රික්කයේ රුපියල් 20,000 කට ආසන්න අගයකි.
- රු:10000 වඩා අඩු දිස්ත්‍රික්ක 13 කි.
- මුලතිව් හා මඩකලපුව දිස්ත්‍රික්කවල අඩුම ඒක ශීර්ෂ ආදායමක් වාර්තා වේ.

## ශ්‍රී ලංකාවේ ඒක ශීර්ෂ ආදායම දිස්ත්‍රික්ක අනුව 2012 - 2013

| දිස්ත්‍රික්කය | ඒක ශීර්ෂ අදායම රුපියල් | දිස්ත්‍රික්කය | ඒක ශීර්ෂ අදායම රුපියල් |
|---|---|---|---|
| කොළඹ | 19346 | මුලතිව් | 6310 |
| ගම්පහ | 14839 | කිලිනොච්චි | 7369 |
| කළුතර | 12559 | මඩකලපුව | 6276 |
| මහනුවර | 10899 | අම්පාර | 8041 |
| මාතලේ | 9392 | ත්‍රිකුණාමලය | 8776 |
| නුවරඑළිය | 9074 | කුරුණෑගල | 11834 |
| ගාල්ල | 10533 | පුත්තලම | 11098 |
| මාතර | 10919 | අනුරාධපුර | 9673 |
| හම්බන්තොට | 11821 | පොළොන්නරුව | 10307 |
| යාපනය | 8246 | බදුල්ල | 9369 |
| මන්නාරම | 6727 | මොනරාගල | 9406 |
| වව්නියා | 11360 | රත්නපුර | 11338 |
| | | කෑගල්ල | 9909 |

මූලාශ්‍රයය - Household Income and Expenditure Survey 2012/2013 - Final Report
Department of Census and Statistics

# ළදරු මරණ අනුපාතය

ශ්‍රී ලංකාවේ **2010** වර්ෂයේ ළදරු මරණ අනුපාතය පහත වගුවෙන් දැක්වේ. එයට අනුව,

- ශ්‍රී ලංකාවේ ළදරු මරණ අනුපාතය **8.4** කි.
- වැඩිම දිස්ත්‍රික්ක ලෙස මඩකලපුව, නුවර එළිය, කොළඹ දැක්විය හැක.
- අඩුම දිස්ත්‍රික්ක ලෙස ත්‍රිකුණාමලය, ගම්පහ, කිලිනොච්චිය ලෙස දැක්විය හැක.

**3.2 වගුව - ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව ළදරු මරණ අනුපාතය - 2010**

| දිස්ත්‍රික්කය | ළදරු මරණ අනුපාතය 2010 | දිස්ත්‍රික්කය | ළදරු මරණ අනුපාතය 2010 |
|---|---|---|---|
| කොළඹ | 14.1 | මුලතිව් | දත්ත ලැබී නැත |
| ගම්පහ | 02.7 | මඩකලපුව | 25.1 |
| කළුතර | 03.3 | අම්පාර | 04.5 |
| මහනුවර | 11.1 | ත්‍රිකුණාමලය | 02.5 |
| මාතලේ | 07.2 | කුරුණෑගල | 09.7 |
| නුවරඑළිය | 14.8 | පුත්තලම | 07.0 |
| ගාල්ල | 09.9 | අනුරාධපුරය | 10.3 |
| මාතර | 09.4 | පොළොන්නරුව | 04.6 |
| හම්බන්තොට | 04.3 | බදුල්ල | 06.2 |
| යාපනය | 03.0 | මොනරාගල | 03.6 |
| කිලිනොච්චිය | 00.9 | රත්නපුරය | 05.7 |
| මන්නාරම | 03.5 | කෑගල්ල | 05.7 |
| වව්නියාව | 08.6 | | |

මූලාශ්‍රය : *Sri Lanka Human Development Report 2012*

# උපතේදී ආයු අපේක්ෂාව

**2002** වර්ෂයේ දී දිස්ත්‍රික්ක අනුව උපතේදී ආයු අපේක්ෂා පහත වගුවෙන් දැක්වේ. එයට අනුව පෙනී යන්නේ ප්‍රාදේශීය වශයෙන් එහි වෙනස්කම් ඇති බවයි.

- ශ්‍රී ලංකාවේ සමස්ත ජනසංඛ්‍යාවේ ආයු අපේක්ෂාව **74.2** කි.
- ස්ත්‍රී ආයු අපේක්ෂාව **78.6** කි.
- පුරුෂයන්ගේ ආයු අපේක්ෂාව **72** කි.

## 3.3 වගුව - ශ්‍රී ලංකාවේ උපතේ දී ආයු අපේක්ෂාව දිස්ත්‍රික්ක අනුව - 2002


| දිස්ත්‍රික්කය | පුරුෂ | ස්ත්‍රී | දිස්ත්‍රික්කය | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|---|---|
| කොළඹ | 61.9 | 71.9 | බදුල්ල | 68.9 | 75.4 |
| ගම්පහ | 71.5 | 80.4 | කෑගල්ල | 72.5 | 80 |
| කළුතර | 72.7 | 80.2 | කිලිනොච්චිය | ද.ලැබී නැත | ද.ලැබී නැත |
| මහනුවර | 67.3 | 75 | මඩකලපුව | 66.8 | 73.8 |
| මාතලේ | 70.7 | 77.5 | අම්පාර | 70.3 | 75.9 |
| නුවරඑළිය | 70.8 | 74.7 | ත්‍රිකුණාමලය | 68.5 | 74.2 |
| ගාල්ල | 70.5 | 78.4 | කුරුණෑගල | 68.9 | 78 |
| මාතර | 73.5 | 80.4 | පුත්තලම | 69.1 | 78.9 |
| හම්බන්තොට | 76.9 | 82.3 | අනුරාධපුරය | 66.5 | 76.1 |
| යාපනය | ද.ලැබී නැත | ද.ලැබී නැත | පොළොන්නරුව | 68.9 | 77.6 |
| මන්නාරම | ද.ලැබී නැත | ද.ලැබී නැත | මොනරාගල | 75.2 | 80.5 |
| වව්නියාව | ද.ලැබී නැත | ද.ලැබී නැත | රත්නපුර | 72 | 78.4 |
| මුලතිව් | ද.ලැබී නැත | ද.ලැබී නැත | | | |

මූලාශ්‍රය : *Sri Lanka Human Development Report 2012*

# සාක්ෂරතාව

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව සාක්ෂරතාව (2012) පහත ප්‍රස්තාරයෙන් දැක්වේ. දකුණු ආසියාතික රටවල් අතර ශ්‍රී ලංකාව ඉහළ ස්ථානයක පවතී.

- 2012 සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව සියයට 95.7 කි.
- පුරුෂ සාක්ෂරතාව සියයට 96.9 කි.
- ස්ත්‍රී සාක්ෂරතාව සියයට 94.5 කි.
- සාක්ෂරතාව දිස්ත්‍රික්ක අනුව ඉහළ අගය ගම්පහින් වාර්තා වන අතර අඩුම අගය මඩකලපුව දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.




3.1 ප්‍රස්තාරය - දිස්ත්‍රික්ක අනුව සාක්ෂරතා අනුපාතය, 2012

ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව නාගරික, ග්‍රාමීය හා වතු අංශ අනුව වෙනස් වේ.

| | |
|---|---|
| නාගරික | - 94.8% |
| ග්‍රාමීය | - 91.8% |
| වතු | - 74.3% |

**සවියෙන් පෙරට අපි එකට**

**e - ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | භූගෝල විද්‍යාව | 2 | 03. ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ අවකාශීය වෙනස්කම් ඇගයීම |

**සැකසුම් - එන්.ආර්.දමයන්ති - ශ්‍රීපාලි විද්‍යාලය**

**පිළිතුරු සපයන්න.**

1. සංවර්ධනය යනු කුමක්දැයි නිර්වචනය කරන්න.
2. සංවර්ධනය මැනීම සඳහා යොදා ගනු ලබන දර්ශක නම් කරන්න.
3. ඉහත ඔබ විසින් නම් කරන ලද දර්ශක පිළිබඳ ව කෙටි විස්තරයක් කරන්න.
4. 2009 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ කුටුම්භ මාසික ආදායම කොපමණද?
5. ශ්‍රී ලංකාවේ වැඩිම හා අඩුම කුටුම්භ මාසික ආදායම ලබන දිස්ත්‍රික්ක පිළිවෙලින් ලියා දක්වන්න.
6. 2015 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ළදරු මරණ අනුපාතිකය ලියා දක්වන්න.
7. ශ්‍රී ලංකාවේ ළදරු මරණ අනුපාතිකය වැඩිම හා අඩුම දිස්ත්‍රික්ක තුන බැගින් නම් කර ඒවායේ අගයයන් ලියා දක්වන්න.
8. ශ්‍රී ලංකාවේ සමස්ත ජන සංඛ්‍යාවේ අයු අපේක්ෂාව කොපමණ ද?
9. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී හා පුරුෂයන්ගෙ ආයු අපේක්ෂාව වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න.
10. ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව කොපමණද?
11. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී හා පුරුෂ සාක්ෂරතාව වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න.
12. ආයු අපේක්ෂාව වැඩිම හා අඩුම අගයන් ගන්නා දිස්ත්‍රික්ක නම් කරන්න.

**සවියෙන් පෙරට අපි එකට**

**e - ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | භූගෝල විද්‍යාව | 2 | 03. ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ අවකාශීය වෙනස්කම් පිළිතුරු |

**සැකසුම් - එන්.ආර්.දමයන්ති - ශ්‍රීපාලි විද්‍යාලය**

1. සංවර්ධනය යනු ආර්ථික , සමාජීයය හා සංස්කෘතික වැනි අංශවල දියුණුව සමඟින් රටක ජනතාවට වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබා දීම යි.

2. ඒක ශීර්ෂ ආදායම, ළදරු මරණ අනුපාතිකය, උපතේදී ආයු අපේක්ෂාව, සාක්ෂරතාව

3. <u>ඒක ශීර්ෂ ආදායම</u>
   කිසියම් රටක නිශ්චිත කාල සීමාවක් තුළ ජාතික ආදායමෙන් එක් පුද්ගලයෙකුට අයත් වන කොටස වේ.

   <u>ළදරු මරණ අනුපාතිකය</u>
   කිසියම් වර්ෂයක් තුළ වයස අවු:01 සම්පූර්ණ වීමට පෙර මියයන ළදරුවන් සංඛ්‍යාව , එම වර්ෂය සජීවී උපත් 1000කට අනුපාතයක් සේ දැක්වීමයි.

   <u>උපතේදී ආයු අපේක්ෂාව</u>
   පුද්ගලයෙකු උපත ලබන විට ඔහුට හෝ ඇයට ඉදිරියට ජීවත් විය හැකි කාලය කොපමණදැයි සාමාන්‍යකරණය කර දැක්වීමයි.

   <u>සාක්ෂරතාව</u>
   කිසියම් රටක ජනසංඛ්‍යාවේ වයස 15 ට වඩා ඉහල පුද්ගලයන්ගේ අකුරු කියවීමට හා ලිවීමට ඇති හැකියාව සාක්ෂරතාව යි.

4. රු.36,451 කි.

5. වැඩිම - කොළඹ

   අඩුම - යාපනය

6. 8.4 කි.

7. වැඩිම අඩුම

| වැඩිම | | අඩුම | |
|---|---|---|---|
| මඩකලපුව | - 25.1 | කිලිනොච්චිය | - 00.9 |
| නුවරඑළිය | - 14.8 | ත්‍රිකුණාමලය | - 02.5 |
| කොළඹ. | -. 14.1 | ගම්පහ. | - 02.7 |

8. 74.2 කි.

9. ස්ත්‍රී - 78.6 පුරුෂ - 72

10. 95.7

11. ස්ත්‍රී - 94.5 පුරුෂ - 96.9

12. වැඩිම - ගම්පහ

    අඩුම - මඩකලපුව